Applications.lk
Job Vacancies / Courses / Examinations / Gazettes / Applications

# අම්බලන්ගොඩ නගර සභාව

## දකුණු පළාත් රාජ්‍ය සේවයේ තනතුරු පුරප්පාඩු

අම්බලන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී පවත්නා පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති දකුණු පළාත් සභා බල ප්‍රදේශය තුල ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කඳවනු ලැබේ.

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන සුදුසුකම් හා බඳවා ගැනීමේ ක්‍රමය |
|---|---|---|---|---|
| 01. | පුස්තකාල සහායක | 01 | PL 1-2016<br>රු. 24,250 - 10x250 - 10x270 - 10x300 - 12x330 - රු. 36,410.00<br>(රා. පරි. ච. ලේ. 3/2016 ප්‍රකාරව ගැලපීම් කරනු ලැබේ.) | අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී දෙවරකට නොවැඩි වාර ගණනකදී යටත් පිරිසෙයින් සම්මාන දෙකක් සහිතව විෂයයන් හය (06)ක් සමත් වී තිබිය යුතු ය. |

*බඳවා ගැනීමේ පොදු සුදුසුකම් :-*

1. අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍යකින් යුක්ත විය යුතු ය. පත්වීම සඳහා තෝරා ගත හොත් මසක් ඇතුලත රජයේ වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටිය යුතු අතර එම පරීක්ෂාවේදී නුසුදුස්සකු වශයෙන් පෙනී ගියහොත් පත්වීම අවලංගු කරනු ලැබේ.
3. ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවු. 18-45ත් අතර විය යුතු ය. (ස්ථිර තනතුරක සිටින අභ්‍යන්තර අයදුම්කරුවෙකුට උපරිම වයස් සීමාව අදාළ නොවේ.)
4. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක දකුණු පළාත තුළ ස්ථිර පදිංචිකරුවකු විය යුතු ය. පදිංචි වසමේ ග්‍රාම නිළධාරි විසින් නිකුත් කරන ලද සහතිකය මත අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර නිකුත් කරන ලද ලියවිල්ලකින් පදිංචිය සනාථ කළ යුතු ය.
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරු වී හෝ රජයේ හෝ රාජ්‍ය සේවයෙන් පහ කරනු ලැබූ අයෙකු නොවිය යුතු ය.

*සේවා නියුක්ත කිරීමේ කොන්දේසි :-*

1. සුදුසුකම් පරීක්ෂා කිරීම ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයේදීම සිදු කෙරේ. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ පූර්ණ අනුමැතිය ලත් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් මගින් සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ.

   සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු ලබා දෙන ක්ෂේත්‍රයන් සහ ලකුණු ප්‍රමාණයන් :

| | ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ක්ෂේත්‍ර | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 1. | අධ්‍යාපන සුදුසුකම් | 30 | 50% |
| 2. | අමතර සුදුසුකම් | 10 | |
| 3. | පළපුරුද්ද | 10 | |
| 4. | සභා බල ප්‍රදේශය තුළ පදිංචිය | 45 | |
| | සම්මුඛ පරීක්ෂණයේදී දක්වන කුසලතාවය | 05 | |
| | එකතුව | 100 | |

2. තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය සම්බන්ධයෙන් රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණ වලට යටත් විය යුතු ය.
3. වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු ය.
4. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
5. මෙයට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයට සහ මුදල් රෙගුලාසි වලට ද, දකුණු පළාත් ගරු ආණ්ඩුකාරතුමාගේ නියෝග වලට ද, වරින් වර දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිකුත් කරන රෙගුලාසි වලට හා නියෝග වලට ද අනුකූලව සේවය කිරීමට බැඳී සිටිය යුතු ය.
6. මෙම ක්ෂේත්‍රයේ පළපුරුද්ද ලබා තිබීම කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.
7. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතර තුර කාල සීමාවේදී හෝ බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ බලය අම්බන්ගොඩ නගර සභාවේ ගරු සභාපති සතු ය.

*අයදුම්පත් ඉදිරිපත් කිරීම*

1. මෙම නිවේදනයේ දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව සකස් කරන ලද අයදුම්පත් ඉදිරිපත් කළ යුතු ය. (අයදුම්පත්‍රය A4 ප්‍රමාණයට සකස් කළ යුතු ය.) අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර පැහැදිලිව සඳහන් කළ යුතු ය. අසම්පූර්ණ, අපැහැදිලි, මෙන්ම නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් කිසිඳු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.
2. සම්පූර්ණ කරන ලද අයදුම්පත් පහත සඳහන් සහතිකවල ඡායා පිටපත් ද සමගින් 2018 සැප්තැම්බර් මස 10 වැනි දිනට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලේකම්, නගර සභාව, අම්බලන්ගොඩ යන ලිපිනයට එවිය යුතු ය.

(අ) උප්පැන්න සහතිකය,
(ආ) අධ්‍යාපන සහතිකය,
(ඇ) මෑතකදී ලබා ගත් චරිත සහතික 02 ක්,
(ඈ) පදිංචිය සනාථ කිරීමට ප්‍රාදේශීය ලේකම් සනාථ කළ ග්‍රාම නිලධාරී සහතිකය,
(ඉ) වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද තිබේ නම් ඒ බව සනාථ කෙරෙන සහතික,
(ඊ) සේවා සහතිකය.

**සැළකිය යුතු යි:-**

දැනට රාජ්‍ය සේවයේ නියුතු වුවත් තමන්ගේ අයදුම්පත් ආයතන ප්‍රධානියාගේ නිර්දේශ මත එවිය යුතු ය. අයදුම්පත් සමග එවන සහතිකවල මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

2018ක් වූ ජූලි මස 19 වැනි දින,
අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේ දී ය.

යොමු අංකය -
(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ආදර්ශ අයදුම්පත්‍රය**

අම්බලන්ගොඩ නගර සභාව

*................................................ තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————————————.
02. මුලකුරු සමග නම :————————————.
03. ස්ථිර ලිපිනය :————————————.
04. ජාතික හැඳුනුම්පත් අංකය :————————————.

05. උපන් දිනය : වර්ෂය :———— මාසය :———— දිනය :————

06. අයදුම්පත් භාරගන්නා අවසන් දිනට වයස :————.

07. ජාතිය :————.

08. ආගම :————.

09. විවාහක/ අවිවාහක බව :————.

10. ස්ත්‍රී/ පුරුෂ භාවය :————.

11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද ? එසේ නම් ඒ පරම්පරාවෙන් ද ? ලියාපදිංචි වීමෙන්ද යන වග :————.

12. දකුණු පළාත් සහා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචි කාලය :————.

13. අධ්‍යාපන සුදුසුකම් :————.

(I) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඃ

| *විෂයයන්* | *සාමාර්ථය* | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

14. ඔබ ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම :————..

15. වෙනත් සුදුසුකම් :————.

16. සේවා පළපුරුද්ද :————.

17. ඔබ කවරදාක හෝ චෝදනාවක් ලැබ උසාවියකින් වරදකරුවකු වී තිබේ ද ? :————.

ඉහත සඳහන් කරන ලද තොරතුරු සත්‍ය හා නිවැරදි බව මෙයින් සහතික කරමි. සාවද්‍ය තොරතුරු සපයා තිබුණහොත් සම්මුඛ පරීක්ෂණයට පෙර හෝ පසුව අපේක්ෂත්වය අවලංගු වන බවත් තෝරා ගැනීමෙන් පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

————.

අයදුම්කරුගේ අත්සන.

**රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන් සඳහා**

ඉහත නම සඳහන් ................................ මයා දැනට මෙම ආයතනයේ ................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය මෙම තනතුරට තෝරාගත හොත් සේවයෙන් නිදහස් කළ හැකි ය./ නොහැකිය. ඔහු/ඇය විනයානුකූල දඬුවමකට ලක් වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————.

දෙපාර්තමේන්තු /ආයතන ප්‍රධානියාගේ අත්සන

නම :————.

පදවි නාමය :————.

දෙපාර්තමේන්තු / ආයතනය :————.

(නිල මුද්‍රාව තබන්න)

දිනය :————.